## ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ (ශ්‍රී ලංකා හරිත දනව් බිම් සංවර්ධන මධ්‍යම අධිකාරිය)

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) පල්ලේකැලේ ගොවිපලේ නිෂ්පාදන කටයුතු සඳහා භාවිතා කරනු ලබන රු.547,868 ක් වටිනා පොලිසැක් මලු 46,555 ක තොගයක් අවසන් තොගය ගණන් බැලීමේදී අත්හැරීම හේතුවෙන් ගොවිපලෙහි සමස්ථ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(ආ) අධිකාරිය සතු වාහන 14 ක්, ලීබඩු උපකරණ ඒකක 100 ක් හා කාර්යාලය උපකරණ ඒකක 72 ක් ක්ෂය කිරීමෙන් පසු අගය රු.1 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අතර, මෙම වත්කම් තවදුරටත් භාවිත තත්ත්වයේ පැවතුණි. එම වත්කම් ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීම නිසා ප්‍රත්‍යගණන අගය මත ක්ෂයවීම් ගිණුම්ගත නොවීමෙන් ඌණතාවයද අඩුවෙන් නිරූපනය විය.

### 1.2.2 නොසැසඳූ පාලන ගිණුම්

පහත සඳහන් නොසැසඳීම් නිරීක්ෂණය විය.

| විස්තරය | 2012 දෙසැම්බර් 31 දිනට<br>මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය | ලේඛනය අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| පැල තවාන - කොත්මලේ | 504,594 | 501,310 | 3,284 |
| බීජ තොගය -එම- | 2,690 | 520 | 2,170 |
| සත්ව තොග -එම- | 196,820 | 201,750 | 4,930 |
| පැල තවාන - පල්ලේකැලේ | 59,519 | 673,865 | 614,346 |
| සත්ව තොගය - එම- | 1,579,990 | 1,322,675 | 257,315 |

### 1.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

වර්ෂ 03 කට අධික කාලයක සිට අය නොවී පවතින රු.2,172,834 ක ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් ශේෂ, ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

| විස්තරය | | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ලැබිය යුතු ආදායම් | 15,463 | උපලේඛන |
| (ආ) | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම | 2,094,281 | ශේෂ සනාථ කිරීම් |
| (ඇ) | ස්ථාවර වත්කම් | 21,582,136 | භෞතික සමීක්ෂණ වාර්තා |

1.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (ආ) මු.රෙ. 103, 104 | අධිකාරියේ නිල වාහනයකට සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 05කදී අනතුරට ලක්ව තිබුණ නමුත් ඒ පිළිබඳ පරීක්ෂණ කටයුතු සිදුකර නොතිබුණ අතර, ඉන් අවස්ථා 03 කට අදාලව පොලිසියේ පැමිණිලිද කර නොතිබුණි. |
| (ආ) මු.රෙ.396(ඞ්) | ජංගම ගිණුම් 02 කට අදාලව පැවති රු.169,546 ක කල් ඉකුත් වූ චෙක්පත් 137 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් කටයුතුවලින් ලැබූ මූල්‍ය ප්‍රතිඵලය රු.32,601,898 ක ඌණතාවයක් වූ අතර, එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.6,419,554 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයේ රු.39,021,452 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. පුනරාවර්තන වියදම රු.13,301,313 කින් වැඩිවීමත්, ප්‍රාග්ධන වියදම රු.11,988,752 කින් වැඩිවීමත්, විශේෂ ව්‍යාපෘති වියදම් රු.3,212,459 කින් වැඩිවීමත්, කුකුල් පාලන වැඩසටහන සඳහා ලැබිය යුතු රු.3,022,763ක මුදල නොලැබීමත්, 2011 වර්ෂයට අදාල රු.10,018,309 ක ව්‍යාපෘති වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ඇතුළත් කිරීමත් මෙම පිරිහීමට හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව 2010 වර්ෂයේ ආරම්භ කරන ලද මහ ඉලුප්පල්ලම ගොවිපල, අසාර්ථක වීම හේතුවෙන් 2012 මැයි මස සිට වසා දමා තිබුණි. මෙම ගොවිපල සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.1,010,762 ක් සහ පසුගිය වර්ෂවලදී රු.8,598,003 ක් වැය කර තිබුණද, එම කාලය තුළ උපයා තිබූ ආදායම රු.248,760 ක් පමණක් විය.

(ආ) අර්ධ ගෘහාශ්‍රිත කුකුල් පාලන ව්‍යාපෘතිය යටතේ, කුකුල් පාලනය වැඩිදියුණු කිරීම වෙනුවෙන් පල්ලේකැලේ ගොවිපල සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් සමාලෝචිත වර්ෂය තුළදී රු.3,597,117 ක් වැය කර තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයට අදාලව ගොවිපලේ මෙහෙයුම් ප්‍රතිඵල ගණනය කිරීමේදී, පසුගිය වර්ෂයේ ලබා තිබූ රු.161,390 ක ලාභයට ප්‍රතිරූපීව සමාලෝචිත වර්ෂයේ ලබා තිබූ අලාභය රු.1,139,805 ක් විය.

(ඇ) කොත්මලේ ගොවිපලට අදාලව සමාලෝචිත වර්ෂය තුළ රු.367,973 ක අලාභයක් ඇතිවී තිබූ අතර, පසුගිය වර්ෂ දෙක තුළදී ද පිළිවෙලින් රු.643,710 ක සහ රු.8,564 ක අලාභ සිදුවී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී සාද නිවාසය නඩත්තුව සඳහා රු.252,021 ක මුදලක් වැය කර තිබුණද, එමගින් උපයා තිබූ ආදායම රු.18,520 ක් පමණක් විය.

(ඉ) අධිකාරිය සතුව පැවති රු.5,000,000 ක මුදලක් 2012 ඔක්තෝබර් මස සත්දින නිවේදන තැන්පතුවල සියයට 7 ක වාර්ෂික පොලිය මත ආයෝජනය කර තිබූ අතර, විගණන අවස්ථාව වූ 2013 මැයි මස වන විටත්, එම තැන්පතුවලින් රු.4,000,000 ක් ඉතිරිව තිබූ බැවින් එම මුදල් දිගු කාලීන ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමෙන් ලබාගත හැකිව තිබූ පොලී ආදායම් අධිකාරියට අහිමි වී තිබුණි.

(ඊ) කාබනික පොහොර නිෂ්පාදනය ප්‍රචලිත කිරීමේ අරමුණින් 2010 වර්ෂයේ ආරම්භ කරන ලද පැනැටියන කාබනික පොහොර ව්‍යාපෘතිය 2012 වසරේදී වසා දමා තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා පසුගිය වර්ෂ දෙක තුළ රු.1,501,963 ක මුදලක් වැය කර තිබූ අතර එම කාලය තුළ ලැබී තිබූ ආදායම රු.56,710 ක් පමණක් විය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

බඳවාගැනීමේ පරිපාටියේ දැක්වෙන සුදුසුකම් සපුරා නොතිබූ අයෙකු 2012 අප්‍රේල් 03 දින සිට පරිපාලන නිලධාරි තනතුරට පත්කර තිබූ අතර ඔහුට 2012 දෙසැම්බර් දක්වා වැටුප් හා දීමනා ලෙස රු.235,630 ක් ගෙවා තිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

2011 ඔක්තෝබර් 31 දිනට රු.344,832 ක් වටිනා කි.ග්‍රෑ.10 පොලිසැක් මලු ශේෂය 28,736 ක් වූ අතර වාර්ෂික ඇසුරුම් මලු අවශ්‍යතාව අනුව එම තොගය ඉදිරි වර්ෂ 24 ක් සඳහා ප්‍රමාණවත්ව තිබියදී, නිසි සැලසුමකින් තොරව 2011 නොවැම්බර් 22 දින රු.125,000 ක් වැය කර තවත් මලු 12,500 ක් මිලදී ගෙන තිබුණි.

3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය තුළ රු.1,461,564 ක් හා පසුගිය වර්ෂවල දී රු.7,313,404 ක් වැය කර අධිකාරියට හිමිකමක් නොමැති ඉඩම්වල ගොඩනැගිලි ඉදිකර තිබුණි.

3.5 අරමුදල් ඌන උපයෝජනය

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වැය විෂයයන් 07 ක් සඳහා වාර්ෂික සංශෝධිත ඇස්තමේන්තුව මගින් සලසා දී තිබූ රු.2,196,500 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

4.6 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්
-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පල්ලේකැලේ ළදරු පාසල, එහි ගොවිපල සහ කොත්මලේ ගොවිපල විසින් භාවිතා කරන ලද විෂයයන් 12 කට අයත් රු.127,794 ක් වටිනා උපකරණද, වටිනාකම තක්සේරු නොකළ විවිධ විෂයයන් 09 කට අයත් උපකරණ ද, භාවිතයෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි.

(ආ) වර්ෂ 03 ක පමණ කාලයක සිට නිකුත් නොවී පවතින, එකතුව රු.1,901,290 ක් වූ වත්කම් අයිතම 100 ක් කෘෂි උපකරණ තොගය තුළ ඇතුළත්ව තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට සේවක පාරිතෝෂික දීමනා සඳහා වෙන් කිරීම රු.12,375,413 ක් වූ අතර එම මුදල් ඵලදායී ආයෝජනයක යෙදවීමට කටයුතු කර නොතිබුණි.

3.7 හඳුනාගන්නා ලද පාඩු
------------------------

පල්ලේකැලේ ගොවිපල තුළ පවත්වාගෙන යනු ලබන අර්ධ ගෘහාශ්‍රිත කුකුල් පැටවුන් නිෂ්පාදන ව්‍යාපෘතියේ විකුණුම් මිල ඉක්මවා නිෂ්පාදන හා නඩත්තු වියදම් දරා තිබීමෙන් පැටවුන් 784 ක් අලෙවි කිරීමෙන් 2012 වර්ෂයේ දී අධිකාරියට රු.42,705 ක පාඩුවක් සිදුවී තිබුණි. තවද මසක් ඉක්මවන ලද කුකුල් පැටවුන්, මසක් වයසැති කුකුල් පැටවුන්ගේ මිලට අලෙවි කිරීමෙන්, පැටවුන් 3726 ක් වෙනුවෙන් ලැබිය යුතුව තිබූ රු.312,942 ක ලාභය අහිමිවී තිබුණි.

3.8 කාර්ය මණ්ඩල පරිපාලනය

| | අනුමත කාර්ය මණ්ඩලය | තථ්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 01 | 01 | -- |
| තෘතීයක මට්ටම | 15 | 12 | 03 |
| ද්විතීයක මට්ටම | 43 | 41 | 02 |
| ප්‍රාථමික මට්ටම | 28 | 26 | 02 |
| | 87 | 80 | 07 |

අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 07 ක් පැවතියද, එම පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.9 වාහන උපයෝජනය

රාජකාරි සඳහා වාහනයක් පරිහරණය කිරීම සඳහා අවසර ලබාදී නොතිබූ අධ්‍යක්ෂවරයෙකු සඳහා 2010 ජූනි සිට අධිකාරියේ වාහනයක් ලබාදී තිබූ අතර, අධිකාරියේ සභාපතිවරයාගේ 2011 අගෝස්තු 30 දිනැති අංක හඅ/පා/3/32-5219 දරන ලිපියෙන් එම වාහනය නැවත අධිකාරියට භාර දෙන ලෙස දන්වා තිබුණද, 2013 මැයි මස වන විටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

4.1 ක්‍රියාකාරි සැලැස්ම

ක්‍රියාත්මක සැලැස්ම මගින් අපේක්ෂිත ඉලක්කයන් සපුරා ගැනීම සඳහා රු.134,145,618 ක ප්‍රතිපාදන වෙන් කරදී තිබුණද, ඉන් රු.86,448,513 ක් හෙවත් සියයට 64 ක් පමණක් ප්‍රයෝජනයට ගෙන තිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය

මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව, ආයතනයේ අභ්‍යන්තර විගණන කටයුතු ඉටු කිරීම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

4.3 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 8 වගන්තිය අනුව සෑම රජයේ සංස්ථාවක් විසින්ම අදාල මුදල් වර්ෂය ආරම්භයට මාස 03 කට ප්‍රථම අයවැය ලේඛනයක් පිළියෙල කර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු වුවත්, අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර, සංශෝධිත ඇස්තමේන්තු පමණක් විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

(ආ) සංශෝධිත ඇස්තමේන්තුවේ සඳහන් වැය විෂයයන් 11 කට අදාළව එකතුව රු.32,465,853 ක් වූ ඉතිරිවීම් දක්නට ලැබුණු අතර, එය සංශෝධිත ප්‍රතිපාදනයට සාපේක්ෂව සියයට 15 සිට සියයට 96 දක්වා පරාසයක පැවතුණි. මේ හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර අධිකාරියේ සභාපතිවරයා දැනුවත් කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) අයවැය පාලනය

(ආ) වත්කම් පාලනය

(ඇ) ගිණුම්කරණය

(ඈ) ගබඩා පරිපාලනය

(ඉ) ගොවිපල කළමනාකරණය